www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ කම්කරුවෝ අපනයන කඩාවැටීමෙන් දැඩි ලෙස පහර කති

**Sri Lankan workers hard hit by export downturn**

අපගේ වාර්තාකරුවන් විසිනි
2009 ජූලි 27

කටුනායක නිදහස් වෙළඳ කලාපය (නිවෙක) ලෝක ආර්ථික පසුබෑස්ම මගින් දැඩි ලෙස පහරකෑමට ලක්වූ ශ්‍රී ලංකාවේ කාර්මික ප්‍රදේශ අතරට ඇතුලත් වේ. කම්කරුවන් දහස් ගනනින් දොට්ට දැමීමට තුඩු දෙමින්, කම්හල් ගනනාවක් ම වැසී තිබේ. ඔවුන්ගේ රැකියා ඕනෑම අවස්ථාවක නැති විය හැකි බවට සමහර කම්කරුවන්ට දැනුම් දී ඇත. වැටුප් කප්පාදු සහ වැඩ පැය ගනන අඩු කිරීම් ක්‍රියාවට දමමින් පවතී.

ජාත්‍යන්තර කම්කරු සංවිධානයට අනුව, මේ වසරේ පලමු මාස තුන තුල පමනක්, ශ්‍රී ලංකාවේ කම්කරුවන් 192,000ක් දොට්ට දමනු ලැබ ඇත. කාර්මික කම්කරුවන් 96,000ක්, ඇඟලුම් කම්කරුවන් 60,000ක් සහ ඉදිකිරීමේ ක්ෂේත්‍රයේ කම්කරුවන් 36,000ක් ඔවුන් අතර සිටී.

කඩාවැටීම් අඛන්ඩව සිදුවේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ මෑත මාසික සමාලෝචනයට අනුව, පසුගිය වසරේ මැයි මාසයට සන්සන්දනාත්මකව මේ මැයි මස අපනයන සියයට 27.8කින් කඩාවැටුනි. රෙදිපිලි සහ ඇඟලුම් ක්ෂේත්‍රවල අපනයන වැටීම සියයට 22.7කි. ජනවාරි සිට මැයි දක්වා කාල පරිච්ඡේදය තුල, අපනයන හා ආනයන යන අංශ දෙකම අඛන්ඩව කඩා වැටී ඇත්තේ, ආර්ථිකයේ කඩාවැටීමක් පෙන්නුම් කරමිනි.

දකුනු කොරියාවේ, චීනයේ, බංග්ලාදේශයේ හා සෙසු රටවල නිදහස් වෙළඳ පොල න්‍යාය පත්‍රයට හැරීමේ කොටසක් ලෙස, 1970 ගනන් අග ලාභ ශ්‍රම වේදිකා ලෙස ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ කලාප පිහිටුවන ලදි. කටුනායක නිවෙක 1978 දී පිහිටුවන ලද අතර ඉන් පසුව කොළඹ උපනගර ප්‍රදේශයක් වන බියගම සහ ගාල්ල දිස්ත්‍රික්කයේ කොග්ගල සෙසු කාර්මික කලාප පිහිටුවන ලදි.

කටුනායක නිදහස් වෙළඳ කලාපයේ ක්‍රියාකාරකම්වලට ඇඟලුම්, මැනික් හා ස්වර්නාභරන, රබර් හා හම්-පාදක නිෂ්පාදන, පිඟන් භාන්ඩ, ලුහු ඉංජිනේරු භාන්ඩ සහ කෘත්‍රිම මල් ඇතුලත් ය. ආයෝජකයන් එක්සත් ජනපදය, ජර්මනිය, ජපානය, චීනය සහ දකුනු කොරියාව යන රටවලින් පැමිනි අයයි.

සෙසු වෙළඳ කලාප මෙන්ම, කටුනායක කලාපය ද කටුකම්බි වැටවලින් වට කරනු ලැබ ඇත. නිවෙක, බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහි යුද ක්‍රියාදාමය තුල දී පිහිටුවන ලද කටුනායක අධි ආරක්ෂිත කලාපයේ කොටසකි. හමුදාව මැයි මාසයේ දී එල්ටීටීඊය පරාජය කල නමුත්, ගුවන් හමුදා කඳවුරට හා ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ගුවන් තොටුපලට සමීපව පිහිටි කටුනායක නිදහස් වෙළඳ කලාපයේ ආරක්ෂක විධිවිධාන ලිහිල් කිරීමේ කිසිදු සලකුනක් වත් නැත.

ආරක්ෂක විධිවිධාන යොදාගන්නේ කම්කරුවන්ගේ නිදහස සීමා කිරීම සඳහා ය. සිය ජාතික හැඳුනුම් පතේ පිටපතක් ඉදිරිපත් කරමින් පොලීසියේ ලියාපදිංචි වීමට ඔවුනට සිදු වේ. කලාපය තුල කන්ඩායම් ලෙස රැස්වීම කම්කරුවන්ට තහනම් ය. පොලීසිය හා කලාපයේ ආරක්ෂක නිලධාරීහු නිරන්තර සෝදිසියෙන් පසුවෙති. යුද්ධය අවසන් වීමට පෙර ප්‍රදේශයේ පිහිටි නිවාස සහ නේවාසිකාගාර මිලිටරි සෝදිසි මෙහෙයුම්වලට හා පොලිස් කඩාපැනීම්වලට නිරන්තරව ලක් විය.

කලාපය තුල මෙන් ම ඉන් පිටත ද ප්‍රධාන සමාගමක් වන කම්කරුවන් 7,000කට අධික පිරිසක් සේවය කරන ස්ටාර් ගාර්මන්ට්ස් ආයතනය පාඩු ලබමින් සිටී. තව දුරටත් දොට්ට දැමීම් වැලකී ඇත්තේ වෙළඳ පොලේ තාවකාලික වෙනස්වීමක් නිසාම පමනක් යයි එක් සේවකයෙක් පැවසීය. දිගු කලක් තිස්සේ පවතින මෙම සමාගම 2007 සිට පසුගිය අප්‍රේල් මස දක්වා කම්කරුවන් 2,200ක් පමන දොට්ට දමා තිබේ.

පසුගිය මාසයේ දී සමාගම ලිපිකරුවන් හා තාක්ෂනික සේවකයන් සිය ගනනකට ඔවුන්ගේ සේවය නතර කරන බවට දැනුම් දුන් අතර එහෙත් ඇනවුම්වල හදිසි ඉහල යාමක් හේතු කොට ගෙන පසුව ඔවුන්

දොට්ට දැමීම අත්හිටුවන ලදි. ඇමරිකානු ගැනුම්කරුවෙක් බාල ප්‍රමිතිය හේතු ලෙස දක්වමින්, බංග්ලාදේශයට හා චීනයට දුන් ඇනවුම් අඩු කර තිබුනි. කෙසේවෙතත් සේවකයෙක් ලෝක සමාජවාදී වෙබ් අඩවියට කියාසිටියේ, තත්ත්වය ශීඝ්‍රයෙන් වෙනස් වන බැවින් සියලු කම්කරුවන්ගේ රැකියා අවදානමේ පවතින බවයි.

මේ වසරේ ජනවාරියේ දී, 1982 දී ඇරඹුනු කටුනායක නිවෙක පිහිටි පැරනිතම ඇගලුම් කම්හලක් වන සිනොටෙක්ස් වසා දමා කම්කරුවන් 2,500ක් පමන දොට්ට දමන ලදි. ඔවුන්ට ගෙවනු ලැබුවේ අවම වන්දියකි.

නැගෙනහිර පලාතේ අම්පාර සිට පැමිනි 30 හැවිරිදි කම්කරු කාන්තාවක් සිනොටෙක්ස් කම්හලේ සේවය කලාය. තමන් වෙනත් සමාගමක රැකියාවක් සොයා ගත් බවත් එහෙත් බොහෝ කම්කරුවන් සිය ගම්බිම් බලා ආපසු ගිය බවත් ඇය පැවසුවාය.

"මම අවුරුදු හතරහමාරක් සිනොටෙක්ස්වල වැඩ කලා. තවත් කම්කරුවො දහස් ගනනක් එක්ක මාව දොට්ට දමන කොට මට වන්දි විධියට ගෙව්වෙ රුපියල් 100,000ක් විතරයි. කම්කරුවන්ගෙ රැකියා ආරක්ෂා කරනවා කියලා නිදහස් වෙලඳ කලාප කම්කරු සංගමය කිව්වත් අපේ රැකියා රැක ගන්න ඒගොල්ල මොනවත් කලේ නැහැ.

"කම්කරුවන්ගෙ වැඩ නතර කරන්න කලින් පරිපාලනය තනි තනි කම්කරුවන්ට කිව්වා ස්වේච්ඡාවෙන් අස්වෙනවා කියලා ලියුම් දෙන්න කියලා. රස්සාව නැති වුනාට පස්සෙ මම ආපසු ගමට ගිහිං මාස පහක් හිටියා. ඒත් හොඳ රස්සාවක් සොයා ගන්න බැරිවුනා. ආපහු කලාපෙට එන්න මට සිද්ධ වුනා."

මෙම හිටපු සිනොටෙක්ස් සේවිකාව දැන් රුපියල් 7,800ක මාසික වැටුපකට ඉසබෙලා ගාමන්ට්ස් ආයතනයේ සේවය කරයි. අතිකාල ගෙවීම් හා සෙසු දීමනා සමග ඇය මසකට උපයන්නේ රුපියල් 10,000කට අඩු මුදලකි. යුද්ධය පිලිබඳව විමසන ලදුව ඇය මෙසේ පැවසුවාය: "යුද්ධය නිසා බොහෝ කරදරවලට මුහුන දෙන්න අපට සිද්ධ වුනා. යුද්ධය ඉවර වෙච්ච එක සහනයක්. ඒත් අපේ ජීවිතවල නම් කිසිම දියුනුවක් නැහැ."

තවත් කම්කරුවෙක් සාකච්ඡාවට එක්විය: " මම කෑගල්ලෙ. අපට යුද්ධය කෙලින්ම බලපෑවෙ නැහැ. ඒ වුනත් ගොඩක් අය හමුදාවට බැඳුනු නිසා යුද්ධයෙන් තමන්ගේ පුත්තු නැති වෙච්ච අම්මලා ගොඩක් දෙනෙක් නිතරම අඩනවා අපි දැක්කා. යුද්ධය ඉවරයි. ඒත් අපි වගේ සාමාන්‍ය මිනිස්සුන්ට සහනයක් නැහැ. ආන්ඩුව ලොකු ව්‍යාපාරිකයන්ට සෑම දෙයක්ම දෙනවා."

දොට්ට දමන ලද සිනොටෙක්ස් කම්කරුවන්ට වන්දි ගෙවන ලද්දේ ආන්ඩුවේ සූත්‍රයකට අනුවය. එනම්, මාස 48ක උපරිමයකට යටත්ව, සේවා කාලයේ සෑම වසරක්ම වෙනුවෙන් මාස දෙකහමාරක වැටුප ගෙවීමයි. සිනොටෙක්ස් කම්කරුවන්ට 2008 වසරේ පාරිතෝෂිකය හෝ නිවෙක නියාමන ආයතනය වන අයෝජන මන්ඩලය විසින් අනුමත කරන ලද 2009 වසර සඳහා වාර්ෂික වැටුප් වර්ධකය වන රුපියල් 1000 මුදල ගෙවා නැත.

නිදහස් වෙලඳ කලාප කම්කරු සංගමයේ නායක ඇන්ටන් මාකස්, සෙසු වෘත්තීය සමිති නායකයන් සහ ආන්ඩුවේ හා සමාගම්වල නියෝජිතයන් සමග ත්‍රයිපාර්ශ්වීය ජාතික කම්කරු උපදේශක මන්ඩලයට සහභාගි වේ. මීට දශක ගනනකට ඉහත දී පිහිටුවන ලද මෙම මන්ඩලය ආන්ඩුව විසින් යලි ක්‍රියාත්මක කරන ලද්දේ, ගෝලීය ආර්ථික පසුබෑස්මේ බර කම්කරුවන් මත පැටවීමේ ක්‍රියාදාමයට වෘත්තීය සමිති වඩා සමීපව ඒකාග්‍ර කරගනු පිනිසය.

නිදහස් වෙලඳ කලාප කම්කරු සංගමය කරන්නේ, රැකියා ආරක්ෂා කිරීම නොව වන්දි මුදල්වලට හිලව් වසයෙන් දොට්ට දැමීම් ක්‍රියාවට දැමීමට සමාගම්වලට සහයෝගය දීමයි. කම්කරුවන් අතර වැඩෙන වෛරය සමනය කර දැමීමේ ප්‍රයත්නයක් ලෙස මාකස් හිටපු සිනොටෙක්ස් සේවකයන් වෙනුවෙන් අමතර වන්දි ඉල්ලා නඩුවක් ගොනු කොට ඇත.

2007 පෙබරවාරියේ දී කම්කරුවන් 1,400ක් රැකියාවලින් පහ කරමින්, ජැකලංකා ලිමිටඩ් හා ජැකලංකා ඉන්ටර්නැෂනල් කම්හල් වසා දමන ලදි. ජැකලංකා කම්හල වසා දමා එහි කම්කරුවන් ජැකලංකා ඉන්ටර්නැෂනල් කම්හලට අනුයුක්ත කිරීමට මාකස් අනුමැතිය දුන්නේය. එහෙත් හිමිකරුවෝ කම්හල් දෙකම වසා දැමූහ.

ට්‍රාන්ස්ෆෝමර් හා විදුලි ධාරිත්‍රක නිපදවන ටොරොයිඩ් ලංකා ලිමිටඩ් සහ ඇගලුම් කම්හලක් වන ස්මාට් ෂර්ට්ස් ලංකා ලිමිටඩ්, එකිනෙක මේ වසර මුල දී කම්කරුවන් 500කට අධික සංඛ්‍යාවක් බැගින් දොට්ට දැමීය. ස්මාට් ෂර්ට්ස් සිය කටුනායක කම්හලේ එක කොටසක් සහ යාබද ප්‍රදේශයක පිහිටි තවත් කම්හලක් වසා දැමීය. තවත් ඇගලුම් කම්හලක් වන නෙක්ස්ට් අප්‍රේල් මාසයේ දී කම්කරුවන් 500ක් දොට්ට දැමීය.

කලාපයේ පිහිටි සෑම කම්හලක්ම පාහේ අතිකාල, පාරිතෝෂික, පැමිනීමේ හා රාත්‍රී දීමනා හා ප්‍රවාහන පහසුකම් කපා දමා තිබේ.

ස්මාට් ෂර්ට්ස් ආයතනයේ තරුන කම්කරුවෙක් මෙසේ පැවසීයඃ "මම කැපුම් අංශයේ අවුරුදු දෙකක් විතර වැඩ කරනවා. අතිකාල එක්ක මගේ මාසික ආදායම රුපියල් 13,000ක් විතර වෙනවා. තවත් දෙන්නෙක් එක්ක ඉන්න කාමරේට මාසෙකට මම රුපියල් 2,000ක් ගෙවන්න ඕන. සමාගමට ලංකාවේ කම්හල් හතක් තිබුනා. ඒවයින් දෙකක් වහලා. පසුගිය මාසවලදි, එක්ස්පොර්ට් ඕඩර් අඩු වෙච්ච නිසා කලාපයේ කම්හල වහවි කියලා කම්කරුවො අතරෙ බයක් තිබුනා. අපි තවම වැඩ කරත් රස්සාව ගැන සහතිකයක් නැහැ.

"උදේ 7.45 ඉඳන් රෑ 8.45 වෙනකන් වැඩ කරන්න අපට සිද්ධ වෙනවා. අපි විනාඩි පහක් ප්‍රමාද වුනොත් ඒගොල්ල අපට විනාඩි 30ක් තිස්සෙ වැඩ වාර්තා කරන්න දෙන්නෙ නැහැ. ඒක අපේ ඉතිරි නිවාඩුවලින් කපනවා. අපට උදේ කෑම නොමිලෙ දෙනවා, දවල් කෑමට ගෙවන්න වෙනවා. කලින් ඒක නොමිලෙ ලැබුනෙ. දැන් අපට ඒකට රුපියල් 30ක් ගෙවන්න වෙනවා. රෑ කෑමට රුපියල් 50ක් ගෙවන්න වෙනවා."

දිනේශ් රත්නකුමා නෙක්ස්ට් ගාමන්ට්හි සේවය කලේයඃ "තවත් කම්කරුවො 500ක් විතර එක්ක අප්‍රේල් මාසෙදි මගේ රස්සාව නැති වුනා. මම ඒකෙ අවුරුද්දක් වැඩ කලා. මම දොට්ට දාපු මාසෙ පඩියත් එක්ක මට ලැබුනෙ රුපියල් 30,000ක් විතරයි. කම්කරුවො ආරක්ෂා කරන්න සංවිධානයක් නැහැ. ඡන්දෙන් තෝරා ගත්ත කම්කරු මන්ඩලයක් තියෙනවා. ඒත් ඒක වැඩ කරන්නෙ කොම්පැනියෙ අන්ඩක් හැටියටයි. කවුරු හරි කම්කරුවන්ගේ අයිතිවාසිකම් ගැන කතා කලොත් එයා වෙන අංශයකට මාරු කරනවා, නැත්නම් රස්සාවෙන් අස් කරනවා.

"මම දැන් වැඩ කරන්නෙ බයිසිකල් හදන ක්‍රියේට්ව් කියන කම්හලෙ. මගේ කලින් සමාගමත් එක්ක බැලුවහම මේකෙ පඩියි සේවා කොන්දේසියි හොඳ නැහැ. මගේ මූලික වැටුප රුපියල් 6,000යි. මාසික ආදායම රුපියල් 10,000ට අඩුයි. මම මගේ අම්මත් බලාගන්න ඕන. කාමරේට රුපියල් 2,300ක් ගෙවන්න වෙනවා. කොහොම වුනත්, රස්සාවක් හොයාගන්න එක ගොඩක් අමාරු නිසා, ජීවත් වෙන්න වෙන ක්‍රමයක් නැහැ.

"කලින් මට ලෝක ආර්ථික අර්බුදය ගැන පැහැදිලි අදහසක් තිබුනෙ නැහැ. රැකියා කප්පාදුවයි ශ්‍රී ලංකාවේ කම්කරුවන්ට එල්ල වෙන අනෙක් ප්‍රහාරයි මේ ලෝක අර්බුදයට සම්බන්ධ බව මට තේරුම් ගන්න පුලුවන්. ඒක නිසා, ඔයගොල්ල කියන විධියට, කම්කරුවන්ට රැකියා හා අනෙකුත් ප්‍රතිලාභ ආරක්ෂා කරගන්න පොදු අරගලයක් අවශ්‍යයි."

© www.wsws.org